**කටාන ප්‍රාදේශීය සභාව - 2023**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

කටාන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට කටාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.4 ඡේදයේ නිරීක්ෂණ හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.28 හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මඟපෙන්වීම්හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී වර්ෂය සඳහා අතිරික්තය රු.112,889,567ක් අඩුවෙන් දක්වා තිබුණු අතර මුදලින් නොවූ ගණුදෙනු කිසිවක් ආපසු ගලපා නොතිබුණි. තවද විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන තිබූ රු.12,711,909 ක ප්‍රාග්ධන වියදම් දීමනාව රු.3,249,894ක් ලෙස ගලපා තිබුණු අතර ලැබියයුතු දැවල වැඩිවීම රු.27,743,931ක් වියයුතු වුවත් රු.38,564ක අඩුවීමක් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ අංක 3.29 හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය රු.321,000,000ක් හා ස්ථාවර තැන්පතු නිදහස් කර ගැනීම් රු.310,550,000ක් ලෙස දක්වනු වෙනුවට, ආයෝජන ලෙස රු.264,396,159ක් මුදල් ගලා ඒමක් දක්වා තිබුණි. තවද, දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් සඳහා වැය කර තිබුණු රු.61,550,705ක දක්වනු වෙනුවට රු.62,027,333ක් මුදල් ගලා ඒමක් දක්වා තිබුණි. | එම | එම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිතියේ අංක 3.30 හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මහපෙන්වීම් හි EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ලැබී තිබූ ප්‍රග්ධන ප්‍රදාන රු.9,449,572ක් හා මූල්‍ය පිරිවැය රු.1,901,588ක් ද දක්වා නොතිබුණි. | පිළිගන්නා බව. | ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.21,750,000ක් වූ මහහුණුපිටිය දමින්නගහවත්ත ඉඩමේ වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | පිළිගන්නා බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේදී සිදු කර තිබුණු ප්‍රත්‍යාගණනය අනුව මාර්ග 18 ක රු.28,750,000 ක වටිනාකම ඉඩම් යටතේ ගිණුම්ගත කර තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා ඊට අදාළ රු.2,875,000ක ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2022 වර්ෂයේදී සිදු කර තිබුණු ප්‍රත්‍යාගණනය අනුව ජල ව්‍යාපෘති 05ක රු.27,417,500ක වටිනාකම ඉඩම් යටතේ ගිණුම්ගත තිබුණ ද සමාලෝචිත වර්ෂය සඳහා ඊට අදාළ රු.685,438 ක ක්ෂය ගිණුම් ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | මුතුවාඩිය කඩ කාමරය සහ වැත්තැව ආදාහනාගාරයේ ගොඩනැගිලි වටිනාකම් පිළිවෙලින් රු.141,208ක් සහ රු.490,000ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ඉඩම් විකිණීම මත බදු රු.996,142කින් රු.633,842ක් ආදායමට නොගෙන පොදු තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | දේපල පිරියත හා උපකරණ අයිතම 12ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.23,440,709ක් ක්ෂය වෙන්කිරීමේ ගිණුමට බැර කරනු වෙනුවට දේපල පිරියත හා උපකරණ වත්කම් බැර කර තිබුණි. | -එම- | -එම- |
| (උ) | ව්‍යාපෘති අවස්ථා 2කට අදාල රු.552,084ක් අලුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2018 වර්ෂයේ ආරම්භ කර තිබුණු පුරනැගුම ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් 2024 මැයි 06 දින වන විටත් අවසන් කර නොතිබියදී 2023 දෙසැම්බර් 31 දින දක්වා වැය කළ රු.97596,694 ක් නොනිම් ලෙස දක්වනු වෙනුවට ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කර තිබුණු හෙයින් සමාලෝචිත වර්ෂය සඳහා රු.2,035,000ක් ක්ෂය කර තිබුණි. | පිළිගන්නා බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී මුදලින් ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.12,711,909ක් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්ථන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් ලෙස වර්ෂයේ අයභාරයට හඳුනාගෙන තිබුණි. | -එම- | -එම- |
| (ඒ) | සමාලෝචිත වර්ෂය තුලදී රු.820,988ක ශුද්ධ අගය වූ දේපල පිරියත හා උපකරණ අපහරණය කිරීමේ අලාභය වූ රු.815,388ක් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගැලපිය යුතු වුවත් විකිණීමෙන් ලද රු.5,600ක ආදායම පමණක් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වූ විවිධ ණයහිමි ශේෂය තුල අදාල වියදම් පියවීමෙන් පසු ඉතිරි වූ රු.3,469,251ක්වූ ශේෂයක අධි වෙන්කිරීම් නිරවුල් කර නොතිබූ හෙයින් ණය හිමි ශේෂය වැඩියෙන් දැක්වේ. | -එම- | -එම- |
| (ඕ) | 2023 වර්ෂයේ ඉඩම් කට්ටිකර විකිණීමේදී සභාව වෙත හිමිවී තිබූ රූඩ් 3 පර්චස් 2.66, පර්චස් 22.43 හා රූඩ් 3යි පර්චස් 12.8ක පොදු පහසුකම් ඉඩම්වල එක පර්චසයක අවම විකුණුම් මිල සැලකිල්ලට නොගෙන ලැබී තිබූ ඔප්පු වටිනාකම වූ රු.100,000ක් බැගින් ඉඩම්වල වටිනාකම් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව එක පර්චසයක අවම විකුණුම් මිල සැලකිල්ලට ගැනීමේදී එම ඉඩම්වල වටිනාකම පිළිවෙලින් රු.37,411,300ක්, රු.6,729,000ක් හා රු.19,521,600ක් වියයුතු වූයෙන් පිළිවෙලින් එම ඉඩම්වල වටිනාකම රු.37,311,300කින්, රු.6,629,000කින් හා රු.19,421,600කින් අවතක්සේරුවී තිබුණු හෙයින් ඉඩම් වටිනාකම රු.63,361,900ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල එකතු හා මූල්‍ය ප්‍රකාශවල ගිණුම් 5ක ශේෂයන් අතර රු.34,253,956ක් වූ නොසැසඳීම් පැවතුණි. | පිළිගන්නා බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | පෙරගෙවුම් | 81,392 | අත්තිකාරම් ලබාදුන් පාර්ශවය හා කාලය | පිළිගන්නා බව. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශේෂ නොගැලපීම්-තොග | 207,906 | උපලේඛන හා කාල විශ්ලේෂණය | -එම- | -එම- |
| (ඇ) | සොරු බිඳීමෙන් වූ අලාභය | 13,698 | උපලේඛන | -එම- | -එම- |
| (ඇ) | ප්‍රාග්ධන ප්‍රදාන වියදම | 3,249,894 | -එම- | -එම- | -එම- |
| (ඉ) | ගිණුම් පොත්පත් | 18,340,030 | ජර්නල් සටහන් | -එම- | -එම- |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය | මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගන්නා බව | යොමුගත රීතියට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති 398 | නිශ්චල දේපල බදුදීමේදී අවම ලංසු අගය තීරණය කිරීම සඳහා රජයේ හෝ පෞද්ගලික වරලත් තක්සේරුකරුවෙකු මගින් සහතික කරන ලද වටිනාකම් පදනම් කර ගත යුතු වුවද අවසන් වරට තක්සේරු වාර්තාවක් ලබාගත් කාලයක් විගණනයට ඉදිරිපත් නොවූ අතර අවම ලංසු අගය ලෙස මස්කඩ හා මාළු කඩ 5ක් සඳහා 2021 වර්ෂයේ ටෙන්ඩර් මුදල ද, සතිපොළ සඳහා 2021 වර්ෂයේ ටෙන්ඩර් මුදලට සියයට 10ක වැඩිවීමක් සහිතව ද තීරණය කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මු.රෙ. 571 | වර්ෂ දෙක ඉක්මවූ රු.7,316,231 ක ඉකුත් තැන්පතු නියාදනය කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 අගෝස්තු 24 දිනැති අංක LGD/09/2019(1) දරන පලාත් පාලන චක්‍රලේඛය | එල්.ජී.21/2 ආකෘතියේ දැක්වෙන පරිදි පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙහි සීමා අනුමත කර ගත යුතුව තිබු නමුත් සභාව විසින් අත්තිකාරම් ගිණුම් සීමාවන් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව | යොමුගත රීතියට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4 | 2023 වර්ෂයේදී කොන්ත්‍රාත් 3කට වඩා වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරතවී සිටි ප්‍රජාපාදක සංවිධාන දෙකකට කොන්ත්‍රාත් 06ක සීමාව ඉක්මවා රු.9,321,647ක්වූ කොන්ත්‍රාත් 05ක් පිරිනමා තිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.122,351,582 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 102,456,438ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| .............. | ............... | ............ | ............ | ............ | ............... | ............ | ............ | ............ |
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 42,901 | 75,610 | 77,501 | 32, 459 | 39,191 | 55,863 | 52,960 | 34,351 |
| කුලී | 3,531 | 794 | 764 | 209 | 4,084 | 1,143 | 1,138 | 179 |
| බලපත්‍ර ගාස්තු | 2,472 | 3,046 | 3,046 | - | 2,703 | 1,689 | 1,689 | - |
| වෙනත් ආදායම් | 181,974 | 263,867 | 263,867 | - | 346,038 | 396,203 | 396,203 | - |
| | ------------ | ---------- | ---------- | --------- | ----------- | ---------- | -------- | --------- |
| | 230,878 | 343,317 | 345,178 | 32 ,668 | 392,016 | 454,898 | 451,990 | 34,530 |
| | ======= | ===== | ====== | ===== | ======= | ===== | ===== | ===== |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු වෙනුවෙන් පිළිවෙලින් රු.39,191,000ක හා රු.42,901,000ක ආදායමක් ඇස්තමේන්තු කර පිළිවෙලින් රු.55,863,000ක හා 75,610,000ක ආදායමක් බිල්කර තිබීමෙන් වරිපනම් හා බදු සඳහා ආදායම් ඇස්තමේන්තු කිරීම තාත්වික නොවිය. | පිළිගන්නා බව. | තාත්විකව ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති ණය හිමියන්ගෙන් කර්මාන්ත ණයහිමි ශේෂය රු.177,290,307ක් වූ අතර ඉන් රු.1,515,527ක් වර්ෂ තුනකට වැඩි ශේෂයන් විය. | පිළිගන්නා බව. | කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන ගැසට් නිවේදනය අනුව සභාව විසින් පරිසර බලපත්‍ර ලබාදිය යුතු ආයතන හඳුනා ගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | -එම- | අදාල සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙමංහන්දිය හා ආඬිඅම්බලම උප කාර්යාල 2ක විසින් සංචාරක මණ්ඩලයේ හෝටල්වලින් ලැබෙන ආදායම සටහන් කිරීමට අදාල ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණු නිසා ලැබෙන ආදායම් නිවැරදිව තක්සේරු කර අයකිරීම් සිදුකරනු ලබයි ද යන්න පිළිබඳව හා අදාල හෝටලවල ගිණුම් වාර්තා පිටපතක් හෝ අදාල රිසිට්පත්වල පිටපත් හෝ නොවූ හෙයින් 2023 වර්ෂය සඳහා ලැබී තිබුණු රු.417,269ක ආදායම් පිළිබඳව ද සෑහිමට පත්විය නොහැකි විය. | -එම- | අදාල ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පූර්ව ලිඛිත අවසරයක් ලබා නොගෙන බ/ කටාන කැබැල්ලගස් හන්දිය කඩකාමර කඩ කාමර 3ක් අතුරු බදුකරුවන් විසින් භුක්ති විඳින බව අනාවරණය වූ අතර මියගොස් සිටි බදුගැණුම්කරුවකුගේ නමින් අතුරු බදුකරුගෙන් බදුකුලී ලබාගන්නා බව ද අනාවරණය විය. | පිළිගන්නා බව. | අතුරු බදු සඳහා ලිඛිත අවසර ලබා ගත යුතුය. |
| (ආ) | ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණු රද්දොළුව මුතුවාඩිය හන්දිය පිහිටි කඩ කාමර 3ට අදාලව බදුකරුවන් සමඟ වූ ගිවිසුමක් හෝ නොතිබුණු අතර ඉන් කඩ කාමර 2කට අදාලව ලේඛනගත බදුකරු හා දැනට ව්‍යාපාරය කරගෙන යන පුද්ගලයන් වෙනස් වුවද අතුරු බදු ලබාදීමක් | පිළිගන්නා බව. | අදාල ගිවිසුම් හා ලිපිගොනු පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි. | | |
| (ඇ) උදම්මිට බහුකාර්ය ගොඩනැගිල්ලෙහි උඩු මහලෙහි හා බිම් මහලෙහි පැවති කඩ කාමර 7ක් බදු දීම සඳහා ලේඛනයක් හා වෙන වෙනම ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඉන් කඩ කාමර 6කට අදාලව 2023 දෙසැම්බර් 31 දින වන විට රු.215,100ක් වූ කුලී හිඟ මුදල් අයකර ගැනීමට සභාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොවීය. | ඉතිරි හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරමි. | අදාල ලේඛන හා ලිපිගොනු පවත්වා ගෙන හිඟ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව වැඩ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර මිලදී ගැනීම් සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද එම සැලැස්ම 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය අනුව පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මක් නොවීය. | පිළිගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ අරමුදල් ප්‍රතිපාදන ලැබී ප්‍රජාපාදක සංවිධාන යටතේ ඉටු කිරීමට නියම කර තිබූ එකතුව රු. 5,500,000ක්වූ ව්‍යාපෘති 4 ක් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් මගින් මිල ගණන් කැඳවා ඉටුකරගෙන තිබුණි. | පිළිගන්නා බව. | අරමුදල් සම්පාදන ආයතනයේ උපදෙස් මත කටයුතු කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සේවය අතහැර ගිය නිලධාරින් 6 දෙනෙකුගෙන් අය විය යුතු රු.699,440ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අය කර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(I) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි. | පිළිගන්නා බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |